AIA විසින් 2021 වසරේ අලෙවි කරන සෑම ඔප්පුවක් සඳහාම
රු. 100 ක් ශ්‍රී ලංකා පිළිකා සංගමයට පරිත්‍යාග කිරීමට පොරොන්දු වෙයි.

# AIA සුපර් ප්‍රොටෙක්ටර් ෆ්ලෙක්සි

## පිරිමැසුම්දායක ජීවිත රක්ෂණ විසඳුමක්



AIA ඉන්ෂුවරන්ස්

HEALTHIER, LONGER, BETTER LIVES


# අප ජීවිතය ලෙස හඳුන්වන මෙම ගමනට විවිධ සන්ධිස්ථාන ඇති අතර අප සෑම කෙනෙකුම එම ගමනේ වෙනස් අවධිවල සිටින්නෙමු.

අපගේ අත්දැකීම්, අපගේ අවශ්‍යතා, අපගේ සිහින හා අභිලාෂයන්, සියල්ල එකිනෙකාට වෙනස්. සමහරු තරුණ වියේ සැහැල්ලුව හා ජීවිතයේ ත්‍රාසජනක අත්දැකීම් බලාපොරොත්තු වේ. තවත් අය ජීවිතය බෙදාහදා ගැනීමට හවුල්කරුවෙකු වෙනුවෙන් කැපවීමට බලා සිටියි. සමහරු පවුලට නව සාමාජිකයෙක් බලාපොරොත්තුවෙන් සිටින අතර තවත් සමහරු ඔවුන්ගේ සිහින විශ්‍රාම දිවියට එළඹීමට නොඉවසිල්ලෙන් බලා සිටියි. අපගේ ජීවිත පොතෙහි අප සිටින පරිච්ඡේදය අනුව අපගේ අවශ්‍යතා සහ අපේක්ෂාවන් වෙනස් වේ.

## ජීවිතයේ විවිධ අවධි



නමුත් අප කුමන අවධියක සිටියත්, හැම කෙනෙකුටම වගේ පොදු හා නිරතුරුවම නොවෙනස්ව පවතින එක් දෙයක් තිබෙනවා. ඒ අපේ පවුල. අපට හැකි පමණින් හොඳම දේ ලබා දෙන, වඩාත් ආදරයෙන් රැකබලා ගන්නා අපගේ ආදරණීයයන්. ඒ අප ඔවුන්ව රැකබලා ගනීවි යැයි අපේක්ෂාවෙන් සිටින, අපගේ දෙමව්පියන්, ජීවන සහකරු හෝ සහකාරිය සහ අපේ දරුවන් විය හැකියි.




ඔබ ජීවිතයේ කුමන අවධියක සිටියත්, අනපේක්ෂිත වියෝවීමකදී වුවද ඔබගේ ආදරණීයයන් සුරක්ෂිත විය යුතුය. ඔබ නොමැති විට පවා ඔවුන්ගේ හුරුපුරුදු ජීවන රටාව දිගටම පවත්වාගෙන යාමට ඔවුන් මූල්‍යමය වශයෙන් සුරක්ෂිත විය යුතුය.

# මේ පිළිබඳව ඔබට වෙනත් අදහස් තිබිය හැකියි...



# නමුත් ඔබේ පවුලේ රැකවරණය තහවුරු කිරීම කල් දැමිය යුතු දෙයක් කියා ඔබ ඇත්ත වශයෙන්ම සිතනවා ද?

## ජීවිතය කෙතරම් අස්ථිර විය හැකිදැයි සිතා බලන්න...

ශ්‍රී ලංකාවේ, **දිනකට පුද්ගලයින් 8 දෙනෙකු පමණ** මාර්ග අනතුරු හේතුවෙන් මිය යයි

ගෝලීය වශයෙන්, **සෑම වසරකම මිලියන 1.25 ක් මාර්ග අනතුරු හේතුවෙන් මිය යයි**




Source: www.themorning.lk/safe-roads-and-reducing-accidents/

2020 ජනවාරි සිට ජුනි මාසය දක්වා කාලය තුළ **මෝටර් රථ අනතුරු 8,880 ක්** වාර්තා වී ඇත

වැඩිම මරණ සංඛ්‍යාව ලෙස වාර්තා වන්නේ **යතුරුපැදි කරුවන්**

2 වැනියට වැඩිම මරණ සංඛ්‍යාව **පදිකයින්ය**


**ඒ වගේම අමතක කරන්න එපා:**



ශ්‍රී ලංකාවේ මරණ වලින් **75% ක්ම** සිදුවන්නේ **බෝ නොවන රෝග** නිසා බව



ශ්‍රී ලංකාවේ බෝ නොවන රෝග වලින් සිදුවන මරණ වලින් **35% ක්ම** සිදුවන්නේ **හෘද රෝග** නිසා බව



මරණ සඳහා **ප්‍රධානතම හේතු 20 න් 15 ක්ම** සිදුවන්නේ රෝග වලින් බව



**රෝහල් ගාස්තු වියදම්** ඉහළ යමින් පවතින බව

# AIA සුපර් ප්‍රොටෙක්ටර් ෆ්ලෙක්සි

## ඔබ සහ ඔබට වඩාත්ම වැදගත් වන ඔබේම ආදරණීයයන් සුරක්ෂිත කිරීම සඳහා විශේෂයෙන් නිර්මාණය කර ඇති පිරිමැසුම්දායක ජීවිත රක්ෂණ සැලසුමක්.

AIA සුපර් ප්‍රොටෙක්ටර් ෆ්ලෙක්සි යනු දැරිය හැකි වාරික සහිතව ඔබේ රැකවරණ අවශ්‍යතා අනුව ඔබටම සරිලන පරිදි ලබා ගත හැකි කදිම ජීවිත රක්ෂණ විසඳුමකි. AIA සුපර් ප්‍රොටෙක්ටර් ෆ්ලෙක්සි සමග අමතර ප්‍රතිලාභ 4ක් ඔබට තෝරාගත හැකි අතර එමගින් ඔබේ පුද්ගලික අවශ්‍යතා සහ අපේක්ෂාවන් අනුව ඔබට අවශ්‍ය රැකවරණය සැලසුම් කල හැකියි. ඔබ ජීවිතයේ කුමන අවධියක සිටියත් අපි ඔබට සහ ඔබගේ ආදරණීයයන්ට හොඳම මූල්‍ය රැකවරණය ලබා දෙන්නෙමු.

AIA සුපර් ප්‍රොටෙක්ටර් ෆ්ලෙක්සි සමඟ, ඔබට දීර්ඝ කාලයක් තිස්සේ වාරික ගෙවිය යුතු නැත.



## AIA සුපර් ප්‍රොටෙක්ටර් ෆ්ලෙක්සි

**කෙටි වාරික ගෙවීමේ කාල සීමාවක් සහිත ඔබේ රැකවරණ අවශ්‍යතාවයන් සඳහා පිරිමැසුම්දායක විසඳුමක්**

10 ගෙවීම් 20

10 ගෙවීම් 25

10 ගෙවීම් 30

අමතර ප්‍රතිලාභ **4** ක්

**ඔබගේ විවිධ අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි අමතර ප්‍රතිලාභ සමඟින් ඔබටම සරිලන රැකවරණය ලබා ගන්න.**

# AIA සුපර් ප්‍රොටෙක්ටර් ෆ්ලෙක්සි මඟින් ලැබෙන ප්‍රතිලාභ



# වැඩි වන ජීවිත ප්‍රතිලාභය



ඔබ වියෝවුවහොත් ඔබගේ ප්‍රතිලාභීන්හට ජීවිත ප්‍රතිලාභය ලැබෙනු ඇත.

රක්ෂණ ඔප්පු කාල සීමාව අවසන් වන තුරු හෝ ජීවිත ප්‍රතිලාභ හිමිකම් පෑමක් කරන තෙක්, සෑම රක්ෂණ ඔප්පු සංවත්සරයකදීම සරල රේඛීය පදනමක් මත ජීවිත ප්‍රතිලාභය 5% කින් ඉහළ යයි.

**රු. මිලියන 1 ත් රු. මිලියන 500 ත් අතර ජීවිත ප්‍රතිලාභ වටිනාකමක් තෝරාගැනීමේ හැකියාව.**




## ඔබ දැන සිටියාද?

**නිරන්තරයෙන් වෙනස්වන ඔබගේ ජීවන රටාව, ආදායම් මට්ටම සහ වියදම් සමඟ ගැලපෙන අයුරින් ඔබේ ජීවිත ප්‍රතිලාභය සෑම වසරකම 5% කින් වැඩි වන බව**

## උදාහරණය: වැඩි වන ජීවිත ප්‍රතිලාභය



ජීවිත රක්ෂිතයාගේ වයස - **අවුරුදු 35**

ජීවිත ප්‍රතිලාභය - **රු. මිලියන 20**

රක්ෂණ ඔප්පු කාල සීමාව - **අවුරුදු 20**


### 11 වන වසරේදී වියෝවීමක් සිදුවුවහොත්

### වැඩි වූ ජීවිත ප්‍රතිලාභය

ජීවිත ප්‍රතිලාභය වන රු. මිලියන 20, වාර්ෂිකව 5% කින් (රු. මිලියන 1 කින්) වැඩි වන අතර 11 වන වසර වන විට ජීවිත ප්‍රතිලාභය රු. මිලියන 30ක් වනු ඇත



1 **ජීවිත ප්‍රතිලාභය වශයෙන් රු. මිලියන 30ක්** ප්‍රතිලාභීන්ට වහාම ගෙවනු ලැබේ



# අමතර ප්‍රතිලාභ



## ඔබ කවදා හෝ කල්පනා කර තිබේද?

**හදිසි අනතුරක් හෝ අසනීපයක් හේතුවෙන් අවාසනාවන්ත වියෝවීමකට හෝ නිත්‍ය පූර්ණ අකර්මන්‍යතාවයකට (Totally Permanently Disabled) පත් වුවහොත්, ඔබගේ පවුලේ මූල්‍ය අවශ්‍යතා සපුරාලන්නේ කවුරුන්ද කියා?**




## පවුල් ආදායම් ප්‍රතිලාභය (අමතර ප්‍රතිලාභ)

ඔබ අවාසනාවන්ත වියෝවීමකට හෝ හදිසි අනතුරක් හෝ අසනීපයක් හේතුවෙන් නිත්‍ය පූර්ණ අකර්මන්‍යතාවයකට (Totally Permanently Disabled) පත් වුවහොත්, ඔබේ ප්‍රතිලාභීන්ට ඉදිරි වසර 5 සඳහා 'මාසික ආදායමක්' ලැබෙනු ඇත.

රු. 10,000 සිට ඉහළට ඔබේ පවුලට අවශ්‍ය මාසික ආදායම ඔබට තෝරාගත හැකිය.

**ඔබේ රක්ෂණ ඔප්පුව ආරම්භයේ දී ඇති පවුල් ආදායම් ප්‍රතිලාභ වටිනාකම, මෙම ප්‍රතිලාභයේ හිමිකම් පෑමක් සිදු කරන තෙක්, සෑම රක්ෂණ ඔප්පු සංවත්සරයකදීම සරල රේඛීය පදනම මත 5% කින් ඉහළ යනු ඇත.**

## පවුල් ආදායම් ප්‍රතිලාභය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ උදාහරණයක්:




- ජීවිත රක්ෂිතයාගේ වයස - අවුරුදු 35
- පවුල් ආදායම් ප්‍රතිලාභ වටිනාකම - මාසිකව රු. 200,000
- ජීවිත ප්‍රතිලාභය - රු. මිලියන 20
- රක්ෂණ ඔප්පු කාල සීමාව - අවුරුදු 20

### 11 වන වසරේදී වියෝවීමක් සිදුවුවහොත්

**වැඩි වූ පවුල් ආදායම් ප්‍රතිලාභය**

රු. 200,000 වාර්ෂිකව 5% කින් (රු. 10,000 කින්) වැඩි වන අතර 11 වන වසරේදී පවුල් ආදායම් ප්‍රතිලාභය රු. 300,000ක් වනු ඇත.




රු. මිලියන 20 වාර්ෂිකව 5% කින් (රු. මිලියන 1 කින්) වැඩි වන අතර 11 වන වසරේදී ජීවිත ප්‍රතිලාභය රු. මිලියන 30 ක් වනු ඇත

**2** **ඉදිරි වසර 5 සඳහා රු. 300,000 ක් මාසිකව ගෙවනු ලැබේ**

**ජීවිත ප්‍රතිලාභයට (රු. මිලියන 30) අමතරව**

**1** **රු. මිලියන 30 ක ජීවිත ප්‍රතිලාභය** ප්‍රතිලාභීන්ට වහාම ගෙවනු ලැබේ



## හදිසි අනතුරු මරණ ප්‍රතිලාභය (අමතර ප්‍රතිලාභ)

හදිසි අනතුරක් හේතුවෙන් අවාසනාවන්ත ලෙස වියෝවුවහොත්, ප්‍රතිලාභීන්ට ජීවිත ප්‍රතිලාභයට අමතරව හදිසි අනතුරු මරණ ප්‍රතිලාභ මුදල ද ලැබෙනු ඇත.



## නිත්‍ය අකර්මන්‍යතා ප්‍රතිලාභය (අමතර ප්‍රතිලාභ)

නිත්‍ය පූර්ණ අකර්මන්‍යතාවය - ඔබ හදිසි අනතුරක් හෝ අසනීපයක් හේතුවෙන් නිත්‍ය පූර්ණ අකර්මන්‍යතාවයකට පත් වුවහොත්, ඔබ තෝරාගත් නිත්‍ය අකර්මන්‍යතා ප්‍රතිලාභ මුදල ඔබට ලැබෙනු ඇත.

නිත්‍ය අර්ධ අකර්මන්‍යතාවය - ඔබ හදිසි අනතුරක් හේතුවෙන් නිත්‍ය අර්ධ අකර්මන්‍යතාවයකට පත් වුවහොත්, ඔබේ රක්ෂණ ඔප්පුවේ ප්‍රතිලාභ වගුවේ සදහන් කර ඇති ආකාරයට එකී ප්‍රතිලාභ මුදල ඔබට ලැබෙනු ඇත.




## වාරික ආරක්ෂණ ප්‍රතිලාභය (අමතර ප්‍රතිලාභ)

ඔබ හදිසි අනතුරක් හෝ අසනීපයක් හේතුවෙන් නිත්‍ය පූර්ණ අකර්මන්‍යතාවයකට පත් වුවහොත්, රක්ෂණ ඔප්පු කාල සීමාව අවසන් වන තෙක් ඔබගේ රැකවරණය තහවුරු කරමින් AIA විසින් ඔබ වෙනුවෙන් වාරික ගෙවනු ඇත.



# AIA සුපර් ප්‍රොටෙක්ටර් ෆ්ලෙක්සි ප්‍රතිලාභ ලබා දෙන්නේ කෙසේද?

**තරිඳුගේ වයස (ඔහුගේ ඊළඟ උපන්දිනය වන විට) අවුරුදු 35 කි. විවාහකයෙක් වන ඔහු බිරිඳ සහ දරුවන් දෙදෙනා සමඟ ජීවිතය උපරිමයෙන් විඳිමින් ගත කරයි.**

ඔහු පහත ප්‍රතිලාභ සමඟ AIA සුපර් ප්‍රොටෙක්ටර් ෆ්ලෙක්සි මිලදී ගෙන ඇත.



වයස: **35**

රක්ෂණ ඔප්පු කාල සීමාව: **20**

වාරික ගෙවීමේ කාල සීමාව: **වසර 10**

ජීවිත ප්‍රතිලාභය: **රු. මිලියන 5**

+

## තෝරාගත් අමතර ප්‍රතිලාභ

- වාරික ආරක්ෂණ ප්‍රතිලාභය
- නිත්‍ය අකර්මන්‍යතා ප්‍රතිලාභය **රු. මිලියන 5**
- පවුල් ආදායම් ප්‍රතිලාභය මාසිකව **රු. 50,000**
- හදිසි අනතුරු මරණ ප්‍රතිලාභය **රු. මිලියන 5**


වාර්ෂික වාරිකය **රු. 69,900**

## රක්ෂණ ඔප්පු කාල සීමාව තුළ AIA සුපර් ප්‍රොටෙක්ටර් තරිඳුට සහ ඔහුගේ පවුලට උපකාරී වී ඇති අයුරු

### 13 වන වසරේදී වියෝවීමක් සිදුවන්නේ නම්

### වැඩි වූ පවුල් ආදායම් ප්‍රතිලාභය

රු. 50,000 වාර්ෂිකව 5% කින් (රු. 2,500 කින්) වැඩි වන අතර 13 වන වසරේදී පවුල් ආදායම් ප්‍රතිලාභය රු. 80,000 වනු ඇත.





**2** **ඉදිරි වසර 5 සඳහා රු. 80,000 ක් මාසිකව ගෙවනු ලැබේ**

**ජීවිත ප්‍රතිලාභයට (රු. මිලියන 8) අමතරව**

**තරිඳු වාරික ගෙවිය යුත්තේ වසර 10 ක් සඳහා පමණි. නමුත් තරිඳුට වසර 20 ක් පුරාවට රැකවරණය ලැබෙනු ඇත.**

### වැඩි වූ ජීවිත ප්‍රතිලාභය

රු. මිලියන 5 වාර්ෂිකව 5% කින් (රු. 250,000 කින්) වැඩි වන අතර 13 වන වසර වන විට ජීවිත ප්‍රතිලාභය රු. මිලියන 8 වනු ඇත




**1** **ජීවිත ප්‍රතිලාභය වන රු. මිලියන 8** ප්‍රතිලාභීන්ට වහාම ගෙවනු ලැබේ

# අනෙකුත් වැදගත් තොරතුරු

| රක්ෂණ ඔප්පු කාල සීමාව/වාරික ගෙවීමේ කාල සීමාව | | 1 වන විකල්පය | 2 වන විකල්පය | 3 වන විකල්පය |
|---|---|---|---|---|
| | වාරික ගෙවීමේ කාල සීමාව | වසර 10 | වසර 10 | වසර 10 |
| | රක්ෂණ ඔප්පු කාල සීමාව | වසර 20 | වසර 25 | වසර 30 |

| වාරික ගෙවීමේ මාදිලිය | වාර්ෂිකව, අර්ධ වාර්ෂිකව, කාර්තුමය, මාසිකව |
|---|---|

| ඇතුළත් වීමේ දී වයස සහ ආවරණය අවසන් වීමේදී වයස | | අවම ඇතුළත් වීමේ වයස (ඊළඟ උපන්දිනය වන විට) | උපරිම ඇතුළත් වීමේ වයස (ඊළඟ උපන්දිනය වන විට) | ආවරණ අවසන් වීමේ වයස |
|---|---|---|---|---|
| | ජීවිත ප්‍රතිලාභය | වසර 19 | වසර 56 | වසර 75 |
| | අමතර ප්‍රතිලාභ | වසර 19 | වසර 56 | වසර 75 |

# නිතර අසන ප්‍රශ්න

## 1. AIA සුපර් ප්‍රොටෙක්ටර් ෆ්ලෙක්සි යනු කුමක්ද?

AIA සුපර් ප්‍රොටෙක්ටර් ෆ්ලෙක්සි යනු දැරිය හැකි වාරික සහිතව ඔබේ රැකවරණ අවශ්‍යතා අනුව ඔබටම සරිලන පරිදි ලබා ගත හැකි  පිරිමැසුම්දායක ජීවිත රක්ෂණ විසඳුමකි. ඔබට වඩාත් පරිපූර්ණ ආවරණයක් සහිත විසඳුමක් ලබා දීම සඳහා මෙයට අමතර ප්‍රතිලාභ ඇතුළත් වේ.

## 2. සමස්ත රක්ෂණ ඔප්පු කාල සීමාව පුරාම මා විසින් වාරික ගෙවිය යුතුද?

AIA සුපර් ප්‍රොටෙක්ටර් ෆ්ලෙක්සි යනු කෙටි ගෙවීම් කාලසීමාවක් සහිත ජීවිත රක්ෂණ විසඳුමකි. විකල්ප 3 කින් ඔබේ අවශ්‍යතා අනුව තෝරා ගත හැකිය. AIA සුපර් ප්‍රොටෙක්ටර් ෆ්ලෙක්සි හි වාරික ගෙවීමේ කාල සීමාවන් සහ රක්ෂණ ඔප්පු කාල සීමාවන් පහත දැක්වේ.

| | 1 වන විකල්පය | 2 වන විකල්පය | 3 වන විකල්පය |
|---|---|---|---|
| වාරික ගෙවීමේ කාල සීමාව | වසර 10 | වසර 10 | වසර 10 |
| රක්ෂණ ඔප්පු කාල සීමාව | වසර 20 | වසර 25 | වසර 30 |

## 3. AIA සුපර් ප්‍රොටෙක්ටර් ෆ්ලෙක්සි මා ආවරණය කරන්නේ කුමකින් ද?

**AIA** සුපර් ප්‍රොටෙක්ටර් ෆ්ලෙක්සි ජීවිතාවරණයක් සමගින් ඔබේ අවශ්‍යතාවයට අනුව තෝරා ගත හැකි අමතර ප්‍රතිලාභ හතරකින් සමන්විත රක්ෂණ සැලසුමකි. එමගින් ඔබේ පුද්ගලික අවශ්‍යතා සහ අපේක්ෂාවන් අනුව ඔබට අවශ්‍ය රැකවරණය සැලසුම් කල හැකියි. අමතර ප්‍රතිලාභ 4 පහත පරිදි වේ;

අ) හදිසි අනතුරු මරණ ප්‍රතිලාභය

ආ) නිත්‍ය අකර්මන්‍යතා ප්‍රතිලාභය

ඇ) පවුල් ආදායම් ප්‍රතිලාභය

ඈ) වාරික ආරක්ෂණ ප්‍රතිලාභය

## 4. මට දැනටමත් ඉතිරිකිරීම් තිබේ - මට මෙය අවශ්‍ය වන්නේ ඇයි?

අප අවට පරිසරය අවිනිශ්චිත වන අතර එහි ප්‍රතිඵලයක් ලෙස අපේ ජීවිත කාලය තුළ බොහෝ අනපේක්ෂිත තත්ත්වයන් ඇතිවිය හැකිය. යම් රෝගයකට හෝ අනතුරකට මුහුණ පෑමට සිදුවුවහොත්, ඔබට සහ ඔබගේ ආදරණීයයන්ට ප්‍රමාණවත් මූල්‍ය රැකවරණයක් අවශ්‍ය වනු ඇත. ජීවිත රක්ෂණ සැලසුමක් නොමැති අවස්ථාවක, ඔබ මහන්සියෙන් උපයාගෙන ඉතිරි කරගත් ධනය ඒ සඳහා භාවිතා කිරීමට සිදුවනු ඇත. එබැවින් ඔබේ රැකවරණ අවශ්‍යතා අනුව ඔබටම සරිලන පරිදි ලබා ගත හැකි රක්ෂණ විසඳුමක් හිමි කර ගැනීම අප ඕනෑම කෙනෙකුට අත්‍යවශ්‍ය වේ. AIA සුපර් ප්‍රොටෙක්ටර් ෆ්ලෙක්සි යනු ශ්‍රී ලංකාවේ ඇති හොඳම ජීවිත රක්ෂණ සැලසුමක් වන අතර ඔබට වඩාත් අවශ්‍ය අවස්ථාවලදී ඔබ සහ ඔබේ පවුලේ අය මූල්‍යමය වශයෙන් සුරක්ෂිත කිරීමට එය සමත් වේ.

## 5. ජීවිත රක්ෂණ ප්‍රතිලාභය සමඟ හදිසි අනතුරු මරණ ප්‍රතිලාභයක් ලබා ගත හැකිද?

ඔව්. ඔබේ රක්ෂණ ඔප්පුවට හදිසි අනතුරු මරණ ප්‍රතිලාභය එක් කළ හැකිය. හදිසි අනතුරක් හේතුවෙන් සිදුවන අවාසනාවන්ත මරණයක දී, ඔබේ ප්‍රතිලාභීන්ට ජීවිත ප්‍රතිලාභයට අමතරව හදිසි අනතුරු මරණ ප්‍රතිලාභ මුදල ද ලැබෙනු ඇත.

## 6. ජීවිත ප්‍රතිලාභයේ 5% ක වැඩිවීම රක්ෂණ ඔප්පු කාලය අවසන් වන තෙක් පවතින්නේද?

සෑම රක්ෂණ ඔප්පු සංවත්සරයකදීම සරල රේඛීය පදනමක් මත ජීවිත ප්‍රතිලාභය 5% කින් වැඩි වීම රක්ෂණ ඔප්පු කාල සීමාව අවසන් වන තෙක් හෝ ජීවිත ප්‍රතිලාභයේ හිමිකම් පෑමක් සිදු වන තෙක් පවතිනු ඇත. අවාසනාවන්ත වියෝවීමක දී, වැඩි වූ ජීවිත ප්‍රතිලාභ වටිනාකම ඔබේ ප්‍රතිලාභීන්ට වහාම ගෙවනු ලැබේ.

## 7. නිත්‍ය අකර්මන්‍යතා ප්‍රතිලාභය ඉල්ලා සිටිය හැක්කේ කවර තත්ත්වයන් යටතේ ද?

ඔබ හදිසි අනතුරක් හෝ අසනීපයක් හේතුවෙන් නිත්‍ය පූර්ණ අකර්මන්‍යතාවයකට පත් වුවහොත්, තෝරාගත් ප්‍රතිලාභ මුදල ඔබට ලැබෙනු ඇත. කෙසේ වෙතත්, නිත්‍ය අර්ධ අකර්මන්‍යතා ප්‍රතිලාභය ගෙවනු ලබන්නේ එම අකර්මන්‍යතාවය හදිසි අනතුරක් හේතුවෙන් සිදු වූ විට පමණි. ඔබේ රක්ෂණ ඔප්පුවේ ප්‍රතිලාභ වගුවේ සදහන් කර ඇති ආකාරයට එකී ප්‍රතිලාභ මුදල ඔබට ලැබෙනු ඇත.

## 8. මම අධ්‍යාපන කටයුතු හෝ රැකියාවක් සඳහා විදේශගත වීමට අදහස් කරන්නේ නම්, AIA සුපර් ප්‍රොටෙක්ටර් ෆ්ලෙක්සි සැලසුමක් ලබාගෙන විදේශගතව සිටියදී පැන නගින ඕනෑම අවශ්‍යතාවක් සඳහා එහි ප්‍රතිලාභ හිමිකම් පෑමක් කළ හැකිද?

ඔව්. ඔබ රක්ෂණ ඔප්පුව මිලදී ගන්නා අවස්ථාවේදී ශ්‍රී ලංකාවේ පදිංචිව සිටින ශ්‍රී ලාංකික පුරවැසියෙකු නම් ඔබට රක්ෂණ ඔප්පුවක් ලබා ගත හැකිය. කෙසේ වෙතත්, මෙම රක්ෂණ ඔප්පුවට අදාළ ප්‍රතිලාභ ශ්‍රී ලංකා රුපියල් වලින් ගෙවනු ලබන අතර දීර්ඝ කාලයක් රටින් පිටත සංචාරය කිරීම සඳහා වූ තම අභිප්‍රාය ජීවිත රක්ෂිතයා විසින් එම සංචාරයට පෙර සමාගම වෙත හෙළි කළ යුතුය.

## 9. රක්ෂණ ඔප්පු කාල සීමාව තුළ මා හදිසි වියෝවීමකට පත්වුවහොත් කුමක් සිදුවේද?

අ) ඔබගේ ප්‍රතිලාභීන්ට වැඩි වූ ජීවිත ප්‍රතිලාභ වටිනාකම වහාම ලැබෙනු ඇත.

ආ) ඔබ පවුල් ආදායම් ප්‍රතිලාභය තෝරාගෙන තිබේ නම්, ප්‍රතිලාභීන්ට ඉදිරි වසර 5 සඳහා වැඩි වූ 'පවුල් ආදායම් ප්‍රතිලාභය' ලැබෙනු ඇත.

## 10. පවුල් ආදායම් ප්‍රතිලාභය සහ වාරික ආරක්ෂණ ප්‍රතිලාභය තෝරාගෙන තිබූ අවස්ථාවක මා හදිසි ලෙස නිත්‍ය පූර්ණ අකර්මන්‍යතාවයකට පත් වූයේ නම් කුමක් සිදුවේද?

අ) නිත්‍ය අකර්මන්‍යතා ප්‍රතිලාභය ඔබ වෙත වහාම ගෙවනු ලැබේ.

ආ) ඔබට ඉදිරි වසර 5 සඳහා වැඩි වූ 'පවුල් ආදායම් ප්‍රතිලාභය' මාසිකව ලැබෙනු ඇත.

ඇ) රක්ෂණ ඔප්පුවේ ඉතිරි කාල සීමාව සඳහා ඔබ වෙනුවෙන් AIA විසින් වාරික ගෙවනු ලැබේ.

## 11. මම AIA සුපර් ප්‍රොටෙක්ටර් ෆ්ලෙක්සි රක්ෂණ ඔප්පුවක් මිලදී ගන්නේ කෙසේද?

ඔබට මේ සඳහා AIA වෙල්ත් ප්ලෑනර්වරයෙකු, AIA මූල්‍ය සැලසුම් විධායකවරයෙකු, බලයලත් තැරැව්කරුවෙකු ඇමතීමට හෝ 0112 310 310 හරහා අප ඇමතීමට හැකිය.

## නියමයන් සහ කොන්දේසි

මෙම සැලසුම ලබා ගත හැක්කේ AIA වෙල්ත් ප්ලෑනර්වරයෙකු, AIA මූල්‍ය සැලසුම් විධායකවරයෙකු හෝ බලයලත් තැරැව්කරුවෙකුගෙන් පමණි.

ඕනෑම රක්ෂණ සමාගමක් සහ / හෝ ඕනෑම රක්ෂණ සැලසුමක් තෝරා ගැනීමේ අයිතිය ඔබ සතු වේ. තවද බැංකුවක් හෝ වෙනත් ඕනෑම ආයතනයක් විසින් තම මූල්‍ය සේවාවන් තුල අන්තර්ගත කර ඇති හෝ බැඳී ඇති ඕනෑම රක්ෂණ සැලසුමක් ප්‍රතික්ෂේප කිරීමේ අයිතියද ඔබ සතුවේ. මෙය සැලසුමේ දළ විශ්ලේෂණයක් පමණි. නියමයන් සහ කොන්දේසි අදාළ වේ.

සම්පූර්ණ සැලසුමේ  විස්තර, නියමයන් සහ කොන්දේසි සඳහා කරුණාකර රක්ෂණ ඔප්පුව බලන්න. ඔබේ යෝජනා පත්‍රයට අත්සන් කිරීමට පෙර ඔබට විකුණුම් නිදර්ශනයක් - මිල කැඳවුමක් ලබා දෙනු ඇති අතර එමඟින් සැලසුමේ විශේෂාංග සහ ආවරණයන් තවදුරටත් විස්තර කෙරේ.

SPF - 300000399
V2 - 07/21

AIA Insurance Lanka Limited (Co.No.PQ 18 PB) විසින් නිකුත් කරන ලදී. 07/11/2021

HEALTHIER, LONGER,
BETTER LIVES